## ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

# ව්‍යාපෘති සහකාර (පුහුණු) තනතුර සඳහා බඳවා ගැනීම

පුහුණු ව්‍යාපෘති සහකාර තනතුර සඳහා වසරක කොන්ත්‍රාත් කාලයකට බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:** - ගණිතය සහ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ඇතුළු විෂයයන් හතරකට (4) සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ,

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (1) සමත්ව තිබීම.

**වයස :** - අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- පුහුණු ව්‍යාපෘති සහකාරවරුන් සඳහා රු. 15,000 ක සියල්ල ඇතුළත් මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- අයදුම්කරුවන්, ස්වකීය ජීව දත්ත විස්තරය 2019.04.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ලේකම්, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය, මිලෝදා ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනය වෙත එවිය යුතුවේ.
- සම්මුඛ පරීක්ෂණය මැයි මස කොළඹදී පැවැත්වෙන අතර මේ සඳහා පැමිණීමේ දී අධ්‍යාපන සුදුසුකම් සහ පදිංචිය තහවුරුකරන සහතිකවල මුල් පිටපත් සහ ඡායා පිටපතක් රැගෙන ඒම අනිවාර්ය වේ.

ලේකම්
ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය